සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය | 2018 | 11 ශ්‍රේණිය |
| Second Term Test | 2018 | Grade 11 |

| | | |
|---|---|---|
| කෘෂි හා ආහාර තාක්ෂණය | I | පැය 1 යි |
| Agri & Food Tecnology | I | 1 hour |

සැලකිය යුතුයි :-

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල පිළිතුරු සඳහා (1), (2), (3), (4) ලෙස වරණ හතර බැගින් දී ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරට අදාළ වරණය තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්ණය සඳහා ඔබ තෝරා ගත් වරණයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

නම ..................................................................................................................................................

01. " මඩ සෝදාගත් කළ හෙළ ගොවියා රජකමට පවා සුදුසු ය. " යන ප්‍රකාශය කරන ලද්දේ,

i. ජේම්ස් ටෙලර් ii. රොබට් නොක්ස් iii. හෙන්රි වික්‍රම් iv. E.A. ගුණසිංහ

02. $MI_1$ , $MI_2$ යන මිරිස් ප්‍රභේද නිෂ්පාදනය කළ පහතරට වියළි කලාපයේ පිහිටි බෝග පර්යේෂණායතනය පිහිටි නගරය,

i. ගන්නෝරුව ii. මාකඳුර iii. බෝඹුවල iv. මහඉලුප්පල්ලම

03. මාර්තු සිට සැප්තැම්බර් දක්වා ශ්‍රී ලංකාවට මෝසම් වර්ෂාව පතිත වේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක වන ජල වාෂ්ප සහිත සුළං ප්‍රවාහය ශ්‍රී ලංකාවට ඇතුළුවන දිශාව,

i. ඊසාන ii. නිරිත iii. ගිණිකොන iv. වයඹ

04. උපරිම අවම උෂ්ණත්වමානය යම්කිසි නියමිත කාල පරාසයක් තුල වායුගෝලයේ පැවති උපරිම උෂ්ණත්වය හා අවම උෂ්ණත්වය මැනීම සඳහා භාවිත කෙරේ. මෙහි ද්‍රව ලෙස භාවිතා කළ හැකි වන්නේ,

i. රසදිය හා ජලය ii. මධ්‍යසාර හා ජලය iii. මධ්‍යසාර හා රසදිය iv. රසදිය පමණි

05. හුණුගල් හා ඩොලමයිට් විපරීත වීමෙන් කිරිගරුඬ නිර්මාණය වේ. මේ ආකාරයට විපරීත නයිස් පාෂාණය නිර්මාණය වන්නේ,

i. ග්‍රැනයිට් ii. පෙග්මටයිට් iii. වැලිගල් iv. ක්වාට්ස්

06. වැඩි අස්වැන්නක් ලබා ගැනීමට නම් බෝග වගාවට ප්‍රශස්ත අයුරින් ජලය හා වාතය රඳවාගත හැකි විය යුතුය. මෙම ලක්ෂණ සහිත පාංශු ව්‍යුහ ආකාරය වනුයේ,

i. ස්ථම්භ ආකාර ii. කැටිති ආකාර iii. අනු කෝණාකාර iv. තනි කණිකාකාර

07. බඳුනක තිබූ ශාකයක් ස්ථිරව මැලවී තිබෙනු දැක ශිෂ්‍යයෙක් එම පසෙහි ජලය නොමැති බව ප්‍රකාශ කරන ලදි. නමුත් කෘෂි විද්‍යා ගුරුතුමිය එහි පස් සාම්පලයක් උදුනක රත් කිරීමේදී ජලය ඉවත්ව යන බව දක්නට ලදි. එහි අඩංගු ජලය විය හැක්කේ,

i. ගුරුත්වාකර්ෂක ජලය ii. ජලාකර්ෂක ජලය iii. භූගත ජලය iv. කේෂාකර්ෂණ ජලය

08. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. ජලයෙන් පිරී ඇති අවස්ථාව ක්ෂේත්‍ර ධාරිතාව ලෙස හඳුන්වයි.
ii. ස්ථිර මැලවීමට පත් ශාකයක් ජලය සම්පාදනයෙන් යථා තත්ත්වයට පත්කළ හැක.
iii. වායු ගෝලයේ සංයුතිය හා සැසඳීමේදී පාංශු වාතයේ $Co_2$ ප්‍රමාණය සාපේක්ෂව වැඩිය.
iv. ශාක වලට ලබාගත හැකි ජල ආකාරය වනුයේ ගුරුත්වාකර්ෂණ ජලයයි.

09. A. මිනිසාගේ නොමනා ක්‍රියාකාරකම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ වන ගහනය සීඝ්‍රයෙන් අඩුවී යයි.
B. උමා ඔය ව්‍යාපෘතිය මගින් දක්ෂිණ ලංකාවේ පහත රට වියලි බිම් සඳහා ජලය සැපයීමට බලාපොරොත්තු විය.
C. ශ්‍රී ලංකාවේ විශාලතම ජලාශය මොරගහකන්ද වේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින්,

i. A හා B පමණක් සත්‍යය. ii. A හා C පමණක් සත්‍යය.
iii. A, B, C සියල්ල සත්‍ය වේ. iv. සියල්ල අසත්‍ය වේ.

10. ගෝවා, අබ, සලාද යන ශාක වර්ග අයිති කුලය විය හැක්කේ,

i. සොලනේසියේ ii. බ්‍රැසිකේසියේ iii. රුටේසියේ iv. කුකර්බිටේසියේ

11. බෝග සංස්ථාපනයේ දී තවාන් කර පැල සිටුවීම හෝ කෙළින්ම ක්ෂේත්‍රයේ සිටුවීම කරනු ලබයි. මෙසේ සිටුවීමේදී අඹ, දොඩම් සිටුවනු ලබන්නේ,

i. තනි පේළි ක්‍රමය ii. ත්‍රිකෝණ ක්‍රමය iii. සමචතුරස්‍ර ක්‍රමය iv. පහේ බෙදුම් ක්‍රමය

12. තැටි නගුල යොදා පස පෙරලන ලද කුඹුරක කැට පොඩි කිරීම සඳහා යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන උපකරණයන් ලෙස යෝජනා කළ හැක්කේ,

i. මෝල් බෝඩ් නගුල ii. තැටි පෝරුව iii. ජපන් පරිවර්ත්‍ය නගුල iv. ඇනදත් පෝරුව

13.

| | | | |
|---|---|---|---|
| A | පත්‍ර විචිත්‍ර වීම | (නෙමටෝඩා ) වටපණු | ගෙන්දගම් කුඩු |
| B | කෙසෙල් වද පීදීම | බැක්ටීරියා | කුරේටර් |
| C | දියමලකෑම | දිලීර | කැප්ටාන් |
| D | හිටු මැරීම | වෛරස් | කාබොපියුරාන් |

ඉහත සටහනේ නිවැරදිව දක්වා ඇති වරණයට අදාල ඉංග්‍රීසි අක්ෂරය ලියා දක්වන්න.

i. A ii. B iii. C iv. D

14. තවාන් පාත්තියක බීජ ඇතිරීමේ දී ඇලියක ගැඹුර සහ ඇලි අතර පරතරය තීරණය වන්නේ,

i. ගොවියාගේ කැමැත්ත අනුවය. ii. දේශගුණික තත්ත්ව අනුව.
iii. බීජ විශාලත්වය අනුව iv. භූමියේ ඉඩකඩ අනුව

15. පසේ ඇති අතිරික්ත ජලය ඉවත් කිරීම සඳහා ශාක විශේෂ ද යොදාගත හැක. ඒ සඳහා යොදා ගත හැකි ශාක විශේෂයක් වනුයේ,

i. අඹ ii. වැටකේ iii. කොස් iv. පේර

16. මෙම රූපසටහනේ දැක්වෙන ජල සම්පාදන ක්‍රමය වන්නේ,



i. වළලු ජල සම්පාදනය
ii. ඇලි වැටි ජල සම්පාදනය
iii. බේසම් ජල සම්පාදනය
iv. පිටාර ජල සම්පාදනය

17. ශාක වර්ධනයට බලපාන මහා පෝෂක පමණක් අන්තර්ගත වන වරණය වන්නේ,

i. N, P, Zn ii. N, K, B iii. N, P, K iv. Zn, Fe, B

18. ඒකාබද්ධ ශාක පෝෂක කළමණාකරණය යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

i. කාබනික හා රසායනික පොහොර යන දෙවර්ගයම භාවිත කිරීමයි.
ii. කාබනික පොහොර පමණක් භාවිත කිරීමයි.
iii. රසායනික පොහොර පමණක් භාවිත කිරීමයි.
iv. පොහොර භාවිතයෙන් තොරව බෝග වගා කිරීමයි.

19. පාසල් ගෙවත්තේ වගා කර තිබූ සමහර බඩ ඉරිඟු ශාකවල පත්‍ර දම්පැහැ වී ඇති බව ශිෂ්‍යයෙකු නිරීක්ෂණය කරන ලදි. මෙසේ පත්‍ර දම්පැහැ වීමට හේතු විය හැක්කේ,

i. N පෝෂක ඌනවීමයි. ii. P පෝෂක ඌනවීමයි.
iii. K පෝෂක ඌනවීමයි. iv. Mg පෝෂක ඌනවීමයි.

20. පළිබෝධ පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A - වල් පැළෑටි, රෝග කාරක ජීවීන්, කෘමි හා කෘමි නොවන සතුන් පළිබෝධයන්ට අයත් වේ.
B – පළිබෝධකයින් බෝග වගාවේ ඵලදායීතාවය වැඩි වීමට හේතු වේ.
C - රූපාකාරය අනුව වල් පැළෑටි කාණ්ඩ තුනකට වෙන් කරනු ලබයි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,

i. A හා C පමණි ii. B හා C පමණි
iii. A පමණි iv. A, B, C සියල්ලම

21. රෝගයකට පාත්‍ර වූ ශාකයක කඳ කොටසක් කපා ජල බීකරයකට දැමූ විට සුදු පැහැති යුෂයක් කඳෙන් වැස්සෙනු දක්නට ලැබුණි. මෙම නිරීක්ෂණය මගින් හඳුනා ගත හැක්කේ ශාකයක,

i. දිලීර රෝගයක් වැළඳී ඇති බවය.
ii. බැක්ටීරියා රෝගයක් වැළඳී ඇති බවය.

iii. කෘමි හානියක් නිසා ඇති වූ බලපෑමකි.
iv. වෛරස් රෝගයක් වැළඳී ඇති බවය.

22. ගොවි මහතෙක් තම ගෙවත්තේ කරවිල පත්‍ර මත වසා සිටි කළු තිත් සහිත රතු පැහැති කුරුමිණියෙකු දක්නට ලැබෙන බව කෘෂිකර්ම උපදේශක මහතාට පැවසීය. එමෙන්ම කරවිල පත්‍ර වල නාරටි ඉතිරි වී දැලක් මෙන් දිස්වන ආකාරයට පත්‍ර කා දමා ඇති බව ද පැවසීය. ඉහත සඳහන් තොරතුරු වලට අනුව,

i. එපිලැක්නාගේ හානිය බව තහවුරු කළ හැකිය.
ii. අවුලකපෝරාගේ හානිය බව තහවුරු කළ හැකිය.
iii. මයිටා හානියක් බව තහවුරු කළ හැකිය.
iv. පිටිමකුනාගේ හානිය බව තහවුරු කළ හැකිය.

23. රසායනික පළිබෝධනාශක භාවිතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. එම ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. පළිබෝධනාශක යෙදූ පසු භාවිත කළ නැප්සැක් දියර ඉසින යන්ත්‍රය වාරි ඇලකට සේදිය යුතුය.
ii. පළිබෝධනාශක වගාවට යෙදිය යුත්තේ සුළං හමා යන දිශාවට සමාන්තරවය.
iii. පළිබෝධනාශක යොදන පුද්ගලයා ආරක්ෂාකාරී ඇඳුම් කට්ටලයක් භාවිතා කළ යුතුය.
iv. පළිබෝධනාශක නියමිත සාන්ද්‍රණයට වඩා යෙදීම මගින් ඵලදායීව පළිබෝධ පාලනය කළ හැකිය.

24. වී ශාකයේ විද්‍යාත්මක නාමය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

i. <u>Oryza Sativa</u>  ii. Oryza sativa  iii. <u>oryza sativa</u>  iv. <u>Oryza sativa</u>

25. බිත්තර වී වල පැවතිය යුතු ප්‍රමිතීන් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A – ප්‍රරෝහණ ප්‍රතිශතය 85% ක් හෝ ඊට වැඩි විය යුතුය.
B – බිත්තර වී වල පැවතිය හැකි උපරිම තෙතමන ප්‍රතිශතය 13% කි.
C - වී 500g ක පැවතිය හැකි උපරිම වල් පැළෑටි බීජ සංඛ්‍යාව 05 කි.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,

i. A හා B පමණි  ii. A හා C පමණි
iii. A පමණි  iv. A, B, C සියල්ලම

26. අපිභෞම ප්‍රරෝහණය පමණක් පෙන්නුම් කරන බීජ ඇතුළත් වරණය තෝරන්න.

i. මුං, බටු  ii. වී, කඩල  iii. බෝංචි, බඩ ඉරිඟු  iv. වී, මිරිස්

27. ශාක බද්ධ කිරීම පිළිබඳ පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. අනුජය ලබාගන්නා ශාකයක ශක්තිමත් මූල මණ්ඩලයක් තිබිය යුතුය.
ii. ශාක බද්ධ සන්ධිය ඉහළ සිට පහළට පොලිතින් පටියකින් වෙලීම සුදුසු ය..
iii. ග්‍රාහකය ඉහල අස්වැන්නක් ලබාදෙන ශාකයක් විය යුතුය.
iv. රිකිලි බද්ධය සඳහා ග්‍රහකය ලෙස දිවුල් ද අනුජය ලෙස පැණි දොඩම් ද යොදා ගත හැක.

28. අ.පො.ස.(සා.පෙළ) හදාරන ශිෂ්‍යයෙක් වී බීජ සාම්පලයක ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීම සඳහා පෙට්ටි දීසි ක්‍රමය යොදා ගන්නා ලදි. මෙහිදී බීජ සාම්පලයක් නියෝජනය වන පරිදි බීජ 150 ක නියැදියක් ලබා ගත්තේය. පරීක්ෂණයට භාජනය කල බීජ සාම්පලයේ ඇති බීජ 90 ක් පැල වී ඇති බව නිරීක්ෂණය කළේ ය. එම බීජ තොගයේ ප්‍රරෝහණ ප්‍රතිශතය සොයන්න.

i. 60%  ii. 50%  iii. 80%  iv. 75%

29. අංකුර බද්ධයක් සඳහා ග්‍රාහකයේ H හැඩැති කැපුමක් යොදන විට එයට සවි කිරීමට සුදුසු අනුජයේ හැඩය මින් කුමක්ද? .

i.  ii.  iii.  iv. 

30. ඒකීය සූර්ය ප්‍රචාරණයක් සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

i. එක දඬු කැබැල්ලක මුල් අද්දවා ගැනීමට අවශ්‍ය වූ විට මෙම ප්‍රචාරණ ව්‍යුහ භාවිත කළ හැකි ය.
ii. කොම්පෝස්ට්, වැලි, මතුපිට පස 1 : 1 : 1 අනුපාතයට මිශ්‍ර කිරීමෙන් රෝපණ මාධ්‍ය සකසා ගත හැකිය.
iii. මෙහිදී යොදා ගන්නා පොලිතීන් බදුනෙහි උසෙන් $\frac{1}{3}$ පමණ රෝපණ මාධ්‍ය පුරවනු ලැබේ.
iv. ජල සම්පාදනයේදී යම් යම් ගැටළු මතු වේ.

31. පහත සඳහන් ආරක්ෂිත වගා ව්‍යුහ අතරින් තාවකාලික වගා ව්‍යුහයක් වන්නේ,

i. දැල් ගෘහ ii. වීදුරු ගෘහ iii. පාත්ති ආවරණ iv. ලී පටි නිවාස

32. සමෝධානික ගොවිතැන පිළිබඳව දැක්වෙන සත්‍ය ප්‍රකාශය කුමක්ද?

i. කුඩා ඉඩම් සඳහා වුවද යොදා ගත හැකිය.
ii. මෙම ගොවිතැන් ක්‍රමය සඳහා වැයවන මූලික වියදම අඩුය.
iii. ගොවිපළ පැළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකිය.
iv. නිෂ්පාදන ඒකක කිහිපයක් ඇති නිසා ගොවියාගේ අවදානම හා අවධානය අඩු වීම.

33.

| | |
|---|---|
| බඩ ඉරිඟු | බටු |
| A | බතල |

A සඳහා සුදුසු බෝගයක් වනුයේ,

i. වී ii. බණ්ඩක්කා iii. මුං iv. මඤ්ඤොක්කා

34. බෝගවල අස්වනු හානිය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

A – පෙර අස්වනු සාධක පසු අස්වනු හානිය කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරයි.
B – පළා වර්ගවල අස්වනු හානිය අවම කර ගැනීම සඳහා ඒවා දිවා කාලයේදී නෙලා ගත යුතුය.
C - අන්නාසිවල අස්වැන්න නෙලීමේදී නියමිත දිනට නටුව නොතිබීමෙන් ඵලයට හානි සිදු වේ.
D - මලුවල අස්වනු අසුරා ප්‍රවාහනය කිරීමෙන් අස්වනු හානිය අවමකර ගත හැකිය.

ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශ වනුයේ,

i. A හා C ii. A, B හා C iii. B හා D iv. ඉහත සියල්ලම

35. අඹ අස්වනු නෙලීම සම්බන්ධව පහත දී ඇති ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,

i. අස්වනු නෙළීම දහවල් කාලයේ වුවද සිදු කිරීම සුදුසු ය.
ii. නෙළාගත් අස්වනු සෙවන සහිත සිසිල් ස්ථානයක තැම්පත් කළ යුතුය.
iii. නෙළාගත් අස්වනු විවෘත්ත පොළොව මත රැස්කර තැබිය හැකිය.
iv. අස්වනු එකිනෙක මත ගොඩ ගැසීම සුදුසු ය.

36. මානව පෝෂණයේදී වැදගත් වන පෝෂණ සංඝටක කාණ්ඩ පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A – කාමර උෂ්ණත්වයේ දී ද්‍රව තත්ත්වයේ ඇති ලිපිඩ තෙල් ලෙසද ඝන තත්ත්වයේ පවතින ලිපිඩ මේදය ලෙසද හඳුන්වයි.

B – ශක්ති ප්‍රභවයන් ලෙස සහ දේහයේ වර්ධනය සඳහා ප්‍රෝටීන වැදගත් වේ.

C - විටමින් B හා C ජලයේ ද්‍රාව්‍ය වන අතර A, D, E, K අද්‍රාව්‍යයි.

D - විටමින් E ශරීරයට ඌන වූ විට රුධිරයේ කැටි ගැසීම ප්‍රමාද වේ.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

i. A හා B ii. A හා D iii. A, B හා C iv. ඉහත සියල්ලම

37. ශරීර ස්කන්ධ දර්ශකය ( BMI ) නිවැරදිව දක්වා ඇත්තේ,

i. $BMI = \frac{\text{ශරීර බර ( Kg )}}{\text{උස ( m )}}$

ii. $BMI = \frac{\text{ශරීර බර}^2\text{ ( Kg )}}{\text{උස ( m )}}$

iii. $BMI = \frac{\text{උස ( m )}}{\text{ශරීර බර ( Kg )}}$

ii. $BMI = \frac{\text{ශරීර බර ( Kg )}}{\text{උස}^2\text{ ( m )}}$

38. පාරිභෝගික සෞඛ්‍ය ආරක්ෂිතතාවය සඳහා ආහාර සම්බන්ධව පිළිපැදිය යුතු නීති රීති ඇතුලත් පනත හඳුන්වා ඇත්තේ,

i. 1982 අංක 26 දරන (1991 දී සංශෝධිත) ii. 1980 අංක 26 දරන (1991 දී සංශෝධිත)

iii. 1976 අංක 26 දරන (1991 දී සංශෝධිත) iv. 1986 අංක 25 දරන (1991 දී සංශෝධිත)

39. ආහාර කල්තබා ගැනීම සඳහා භාවිතා කරන පරිරක්ෂක ද්‍රවය වන්නේ,

i. සෝඩියම් කාබනේට් ii. බෙන්සොයික් අම්ලය

iii. කැල්සියම් කාබනේට් iv. මැග්නීසියම් සල්ෆේට්

40. 72 $C^0$ ක උෂ්ණත්වයේ තත්පර 15 ක කාලයක් තබා ක්ෂනිකව 10 $C^0$ දක්වා සිසිල් කිරීම මගින් කිරි කල්තබා ගැනීම කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය,

i. ජීවාණුහරණය ii. බිලාංචීකරණය

iii. පැස්චරීකරණය iv. සාන්ද්‍රිකරණය

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය | 2018 | 11 ශ්‍රේණිය |
| Second Term Test | 2018 | Grade 11 |

| | | |
|---|---|---|
| කෘෂි හා ආහාර තාක්ෂණය | II | පැය 2 යි |
| Agri & Food Tecnology | II | 2 hours |

සැලකිය යුතුයි :-

❖ පළමු ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. ස්වාභාවික තත්ත්ව යටතේ ශාක තම පැවැත්ම තහවුරු කරගැනීම පිණිස වර්ගයා බෝ කරයි. එම ක්‍රියාවලිය ප්‍රජනනය ලෙස හැඳින්වේ.

i) a) ශාක ප්‍රචාරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි සඳහන් කරන්න. ( ලකුණු 01 )
b) ශාක ප්‍රචාරණය සිදුවන ප්‍රධාන ක්‍රම මොනවාදැයි සඳහන් කරන්න. ( ලකුණු 02 )

ii) a) ජීවී බීජයක් ප්‍රරෝහණයට අවශ්‍ය සාධක 02 ක් නම් කරන්න ( ලකුණු 01 )
b) සිටුවීම සඳහා ගන්නා බීජ වල තිබිය යුතු ලක්ෂණ 02 ක් සඳහන් කරන්න. ( ලකුණු 01 )

iii) a) බීජ පැල ලබාගැනීම සඳහා පළමුව එම බීජ තවාන් දමනු ලැබේ. ඒ සඳහා බහුලව යොදාගනු ලබන තවාන් වර්ග 02 ක් නම් කරන්න. ( ලකුණු 01 )
b) තවාන් ජීවාණුහරණය කරගන්නා ක්‍රම 02 ක් සඳහන් කරන්න. ( ලකුණු 01 )

iv) a) ෆැබේසියේ කුලයට අයත් බෝග වර්ග 02 ක් නම් කරන්න. ( ලකුණු 01 )
b) බෝග වර්ගීකරණය කිරීමේ වැදගත්කම් 02 ක් ලියා දක්වන්න. ( ලකුණු 01 )

v) ‘ ජල වහනය ’ යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න. ( ලකුණු 02 )

vi) බෝග වගාව සඳහා ජලයේ ඇති වැදගත්කම් 02 ක් නම් කරන්න. ( ලකුණු 02 )

vii) පූර්ණ රූපාන්තරණයක පවතින අවස්ථා පිළිවෙලින් සඳහන් කරන්න. ( ලකුණු 02 )

viii) පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේදී භාවිතා කරන ගෘහ වර්ග 02 ක් නම් කරන්න. ( ලකුණු 02 )

ix) නිර්පාංශු වගාවේදී භාවිතා කරනු ලබන ඔබ ඉගෙනගත් පෝෂණ මාධ්‍ය 02 ක් ලියන්න. ( ලකුණු 02 )

x) ප්‍රාථමික බිම් සැකසීම සඳහා යොදා ගන්නා සත්ත්ව බලයෙන් ක්‍රියාකරන උපකරණ 02 ක් ලියා දක්වන්න. ( ලකුණු 01 )

02. ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තයට දිගු ඉතිහාසයක් ඇත.

i) a) අතීතයේ අප රට සහලින් ස්වයංපෝෂිතව තිබූ බවට පවතින සාක්ෂි 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02 )
b) එම ස්වයංපෝෂිත බව ලඟාකර ගැනීමට දායක වූ අංශ 02 ක් නම් කරන්න. ( ලකුණු 02 )

ii) a) ශ්‍රී ලංකාවේ නිදහස ලැබීමෙන් පසු බිහි වූ ගොවිජන පද ව්‍යාපාර 04 ක් නම් කරන්න. (ලකුණු 02 )
b) අප රටෙහි දළ දේශීය නිෂ්පාදනයට බලපාන ප්‍රධාන අංශ 02 ක් සඳහන් කරන්න. ( ලකුණු 02 )

iii) බෝග වගාවට වැදගත් වන කාලගුණික පරාමිතීන් 02 ක් නම් කර ඒවා මැනීමට යොදාගන්නා උපකරණ 01 බැගින් නම් කරන්න. ( ලකුණු 02 )

03. පුද්ගලයෙකු ගනු ලබන ආහාරයේ තිබිය යුතු පෝෂක එකක් හෝ කීපයක් නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් තිබීම නිසා ඇතිවන තත්ත්වය මන්දපෝෂණය යි.

i) a) මන්දපෝෂණයේ අයහපත් ප්‍රතිඵල 02 ක් ලියන්න. (ලකුණු 02 )

b) පුද්ගලයෙකුගේ පෝෂණ අවශ්‍යතාව රඳාපවතින සාධක 02 ක් නම් කරන්න. ( ලකුණු 01 )

ii) a) රාත්‍රී අන්ධතාව ඇතිවීම හා ඇස් වල බීටෝ ලප ඇතිවීම යන රෝග ලක්ෂණ දක්නට ලැබෙනුයේ කුමන විටමින් ඌනතාවය හේතුවෙන්ද? (ලකුණු 01 )

b) අයඩීන් ඌණතාවයේ අහිතකර බලපෑම් 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02 )

iii) a) ශ්‍රී ලංකාවේ දැනට පවතින මන්දපෝෂණ ගැටළුව මඟහරවා ගැනීමට ඔබ යෝජනා කරන පිළියම් 02 ක් ලියන්න. (ලකුණු 01 )

b) සමාජයේ විවිධ කොටස් අතරින් මන්දපෝෂණයට බහුලව ගොදුරු වන සමාජ කණ්ඩායම් 04 ක් ලියන්න. (ලකුණු 02 )

04. යම් පාෂාණයක් විවිධ සාධක වල බලපෑමෙන් කුඩා කොටස් වලට පත්වීම භෞතික ජීර්ණයයි.

i) a) පාෂාණ ජීර්ණය සඳහා බලපාන භෞතික හා රසායනික සාධක 02 බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 )

b) පසෙ අඩංගු පාංශු සංඝටක ආකාර 04 ක් නම් කරන්න. ( ලකුණු 02 )

ii) දර්ශීය පාංශු පැතිකඩක රූපසටහනක ඇඳ ප්‍රධාන කලාප නම් කරන්න. ( ලකුණු 04 )

iii) a) ඉහත ඔබ විසින් නම් කරන ලද කලාප අතුරින් පාංශු ජීවීන් වැඩිපුරම දක්නට ලැබෙන කලාප 02 ක නම් කරන්න. (ලකුණු 01 )

b) බඳුන් වගාවක් සඳහා බඳුන් පිරවීමට වඩාත් සුදුසු වන්නේ ඉහත ස්ථර අතරින් කුමන ස්ථර වල අඩංගු පස් ද? (ලකුණු 01 )

05. ප්‍රශස්ත අස්වැන්නක් ලබා ගැනීම සඳහා බෝග වගාවට ශාක පෝෂක අත්‍යවශ්‍ය වේ.

i) a) ශාක පෝෂණයට අදාල මහා පෝෂක හා ක්ෂුද්‍ර පෝෂක වර්ග 2 බැගින් සඳහන් කරන්න. (ලකුණු 01 )

b) ජලයෙන් පමණක් ලබා ගන්නා ශාක පෝෂකය නම් කරන්න. ( ලකුණු 01 )

ii) මේරූ පත්‍ර කහ පාට වීම, වර්ධනය අඩු වී ශාක කුරුවීම, මල් සහ ඵල විකෘති වීම වැනි ඌණතාවයන් දක්නට ඇත්තේ කුමන මූලද්‍රව්‍යයක් ඌණ වීමෙන්ද? එම ඌණතාවය මඟහරවා ගැනීමට යෙදිය යුතු පොහොර වර්ග 2 ක් සඳහන් කරන්න. ( ලකුණු 02 )

iii) a) ඔබ ප්‍රදේශයේ පහසුවෙන් සොයාගෙන කොළ පොහොර ලෙසට භාවිතා කළ හැකි ශාක වර්ග 02 ක් නම් කරන්න. (ලකුණු 01 )

b) කොළ පොහොර ක්ෂේත්‍රයට යෙදිය හැකි ආකාර 02 ක් දක්වන්න. ( ලකුණු 02 )

c) බෝග වගාවේදී ශාක පෝෂණය සඳහා පත්‍ර වලට ඉසිනු ලබන දේශියව නිස්සාරණය කළ හැකි දියර පොහොර වර්ග 02 ක් නම් කරන්න. ( ලකුණු 02 )

06. වර්තමානයේ බෝග වගාවට හානි පමුණුවන ජීවීන්ගේ ස්වභාවික සතුරන්ගේ වර්ධනය සීඝ්‍රයෙන් අඩුවී යන බව පෙනේ. තවද නව ප්‍රතිරෝධී කෘමි පළිබෝධ ප්‍රභේද බිහිවී ඇත.

i) a) " පළිබෝධ " යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02 )

b) ඔබ දන්නා ආක්‍රමණශීලී වල් පැළෑටි වර්ග 02 ක් නම් කරන්න. ( ලකුණු 02 )

ii) a) රූපාකාරය අනුව වල් පැළෑටි වර්ගීකරණය කිරීමේදී තෘණ සහ පත් වර්ග වල වෙනස්කම් කරුණු 02 ක් ඔස්සේ සන්සන්දනය කරන්න. (ලකුණු 02 )

b) බෝග වගාවට හානිකරන පහත දැක්වෙන පළිබෝධයන්ගේ ස්වභාවික සතුරන් 01 බැගින් නම් කරන්න.

ගොයම් මැස්සා -
ගොළුබෙල්ලා -
සැල්වීනියා - (ලකුණු 03 )

iii) වර්තමානයේ භාවිතයෙන් ඉවත් කර ඇති රසායනික වල් නාශකය කුමක්දැයි සඳහන් කරන්න.(ලකුණු 01 )

07. වර්තමානයේ ශ්‍රී ලංකාවේ වී වගාව වඩාත් ප්‍රචලිත කරවීම සඳහා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත.

i) a) ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා ඇති විභවයන් 02 ක් නම් කරන්න. (ලකුණු 02 )

b) ගොයම් පැළෑටියේ වර්ධන අවධි උපයෝගීකරගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වර්ධන අවධි | ගතවන කාලය |
|---|---|
| 1. වර්ධන අවධිය (මාස $3\frac{1}{2}$ ) | දින 45 |
| ……………… (මාස 4) | ……………………….. |
| 2. ……………………. | දින 30 |
| 3. මේරීමේ අවධිය | ……………………… |

( ලකුණු 02 )

ii) a) පාරම්පරික වී ප්‍රභේද හා වැඩිදියුණු කළ වී ප්‍රභේද වල දැකිය හැකි ලක්ෂණ 02 බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 )

b) වී වගාවේ පළමු සී සෑම හඳුන්වන වෙනත් නමක් සඳහන් කරන්න. (ලකුණු 01 )

iii) a) වී වගාවට සුදුසු ජල සම්පාදන ක්‍රමය නම් කර එහි එක් අවාසියක් සඳහන් කරන්න. (ලකුණු 01 )

b) වී වගාවේ බහුලව භාවිතා කරන රසායනික වල් නාශක හේතුවෙන් මිනිසාට ශරීරගත විය හැකි බැර ලෝහයක් නම් කරන්න. (ලකුණු 02 )

08. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන වල එළවළු හා පළතුරු 40% ක් පමණ අපතේ යන බව අප බොහෝ දෙනෙක් දන්නා කරුණකි. එය ඒවායෙහි මිළ ඉහළයාමට හේතුවක් වේ.

i) a) පසු අස්වනු හානිය සිදුවිය හැකි අවස්ථා 02 ක් නම් කරන්න. (ලකුණු 02 )

b) පෙර අස්වනු හානිය අවම කිරීම සඳහා ගතයුතු ඔබ ඉගෙනගත් උපායමාර්ග 02 ක් ලියන්න.(ලකුණු 02 )

ii) කෘෂි නිෂ්පාදන වල මිළ ඉහළ යාමට පසු අස්වනු හානිය කෙසේ බලපාන්නේ දැයි කරුණු දෙකකින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 )

iii) a) ජීවාණුහරණය කරන ලද ආහාර පරිසර උෂ්ණත්වය යටතේ වුවද වැඩි කළක් නරක් නොවී තබා ගත හැක. නමුත් පැස්චරීකරණය කරන ලද ආහාර එසේ තබාගත නොහැක. ඒවා ශීතකරණ තත්ත්ව යටතේ ගබඩා කෙරේ. එම වෙනසට හේතු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 )

b) අඹ ජෑම් නිෂ්පාදනයේදී මිශ්‍රණය ඝන වීම සඳහා යොදාගන්නා ඝනවීමේ කාරකයක් නම් කරන්න. (ලකුණු 02 )